# නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY

## සුදුසුකම්ලත් තැනැත්තන් ලියාපදිංචි කිරීම - 2019

## සුදුසුකම්ලත් තැනැත්තෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ආරාධනයයි

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ **(ICTAD)** හි නෛතික අනුප්‍රාප්තිකයා වන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, **(CIDA)** ඉදිකිරීම් කර්මාන්තයේ බලයලත් නියාමන අධිකාරිය වශයෙන් **2014** අංක **33** දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ, **26** වන වගන්තිය ප්‍රකාරව, වෘත්තීයවේදී ප්‍රමිතිය ප්‍රවර්ධනය කරලීමේ අරමුණින් සුදුසුකම්ලත් තැනැත්තන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා වරය පනවනු ලැබ සිටී. සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම් නියාමනය /රෙගුලාසි පිලිබඳ ගැසට් නිවේදනය, එළඹිය යුතු හා පිළිපැදිය යුතු සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ උපමාන/නිර්ණායක, ගාස්තු හා නැවත අලුත් කිරීම සඳහා ගාස්තු හා සැලසුම්, නිර්මාණය සහ ප්‍රලේඛන කටයුතු පිලිබඳ ප්‍රමිතීන් ද නිර්දේශ කරමින් අංක **2057/5** හා **2018.02.05** දරන ගැසට් පත්‍ර පළකර ඇත.

ඒ අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය **(CIDA)** පහත දැක්වෙන වර්ගවල / කාණ්ඩවල පුද්ගලයින් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරයි.

(අ) ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව සහ ප්‍රමාණ සමීක්ෂණය යන විෂය ක්ෂේත්‍රවල පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක / ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL), ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (SLIA), ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනය (IQSSL) වැනි ශ්‍රී ලංකික වෘත්තීයවේදීන්ගේ ආයතනයක සාමාජිකයෙකු වන පුද්ගලයෙකු

(ආ) ශ්‍රී ලාංකික වෘත්තීයවේදී ආයතනයක (IESL, SLIA, IQSSL) / පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක සාමාජිකයෙකු / ලියාපදිංචි වූවකු නොවන, එනමුත් එකී විෂය ක්ෂේත්‍රවල අදාළ වන හා සම්බන්ධිත සහ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන අයෙකු

(ඇ) ශ්‍රී ලාංකීය වෘත්තීයවේදී ආයතනයක (ඉහත සඳහන් ආයතන හැර) / පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරන ලද ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක (ඉදිකිරීම් කර්මාන්තයට අදාල වන) සාමාජිකයෙකු / ලියාපදිංචි වූ වෙනත් ඕනෑම අයෙකු

(ඈ) වර්ගයට / කාණ්ඩයට වැටෙන වෘත්තීයවේදීන්, අදාළ වෘත්තීයවේදී ආයතන / මණ්ඩල හරහා ලියාපදිංචි කරනු ලැබේ.

අයදුම්පත්‍රය / ආකෘතිපත්‍රය ඇතුළුව, ලියාපදිංචි කිරීමේ යෝජනා ක්‍රමයේ විස්තර හා අදාල ගාස්තු **CIDA** (සීඩා) හි වෙබ් අඩවිය වන http://www.cida.gov.lk වෙතින් බාගත (download) කර ගත හැකි ය. (ආ) සහ (ඇ) වර්ග / කාණ්ඩ සඳහා වන අයදුම්පත් / ආකෘතිපත්‍ර, රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කොළඹ 07, විජේරාම මාවතේ, " සව්සිරිපාය", අංක. 123 හි, **CIDA** (සීඩා) හි, තොරතුරු මධ්‍යස්ථානයේදී නොමිලේ ලබා ගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත් අදාල තොරතුරු විස්තර සමග කොළඹ 07, විජේරාම මාවතේ, "සව්සිරිපාය" හි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය **(CIDA)** හි, අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු ය.

පනතේ අංක 31 දරන වගන්තියේ නියම කර ඇති පරිදි කිසිදු පළාත් අධිකාරියක් / (ප්‍රාදේශීය බල මණ්ඩලය) විසින් සුදුසුකම්ලාභී පුද්ගලයෙකු විසින් අදාල ඉදිකිරීම් කටයුතුවලට සම්බන්ධව, වාස්තු විද්‍යාත්මකව, ව්‍යුහමය, විදුලි හා ජල සම්පාදන, මලාපවහන හා වෙනත් ඉදිකිරීම්වලට අදාල සැලසුම් හා සේවා සිදුකරන්නන් හැර, කවර හෝ හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා, ගොඩනැගිලි අනුමැතිය සඳහා කිසිදු අයදුම්පතක් භාර නොගත යුතු ය.

ගැසට් පත්‍රයේ පළ කරන ලද පරිදි හඳුනාගත් ඉදිකිරීම් වැඩ, අධීක්ෂණය, කොන්ත්‍රාත් ලිපිලේඛන පිළියෙල කිරීම, සැලසුම්කරණය යනාදියෙහි, ලියාපදිංචි වූ සුදුසුකම්ලත් තැනැත්තන් පමණක් නියැලෙන බවට තහවුරු කර ගැනීමේ අභිලාෂයෙන් යුතුව **CIDA** සමග ලියාපදිංචි වී ඇති සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ ලැයිස්තුවක්, නාගරික සංවර්ධන අධිකාරිය (UDA) හා සියලු පළාත් බලධාරීන් /ආයතනයන් වෙත 2019 පෙබරවාරි 22 දින වනවිට යැවීමට **CIDA (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය)** අදහස් කරන හෙයින් සියලුම සුදුසුකම්ලත් තැනැත්තන්, 2019 පෙබරවාරි 07 වැනිදාට පෙර **CIDA** වෙතින් එම ලියාපදිංචිය ලබා ගත යුතු බැව් දැනුම් දෙනු ලැබේ.

මෙම ලියාපදිංචිය පිලිබඳ වැඩිදුර තොරතුරු අධ්‍යක්ෂක (උපදේශන සේවා) වෙතින් දුරකථන : 011-2688143 මගින් විමසා ලබාගත හැකිය.

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**